# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2060/10 – 2018 පෙබරවාරි මස 26 වැනි සඳුදා – 2018.02.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස: පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

1972 අංක 07 දරන ගෙවල් කුලී පනත

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය හා 1972 දරන ගෙවල්කුලී පනතේ 43 වැනි වගන්තිය යටතේ මට පැවරී ඇති බලතල අනුව හා එම පනතේ 44 වැනි වගන්තියට අනුව බස්නාහිර පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍ය, කැප්ටන් ලලිත් වනිගරත්න වන මා විසින් පහත සඳහන් ආඥාව කරනු ලැබේ.

**කැප්ටන් ලලිත් වනිගරත්න,**
මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන,
වෙළඳ, නිවාස ඉදිකිරීම්,
වතු යටිතල පහසුකම්, ග්‍රාම සංවර්ධන අමාත්‍ය
බස්නාහිර පළාත.

2018ක් වූ ජනවාරි මස 02 වැනි දින,
බත්තරමුල්ල දී ය.

ආඥාව

බස්නාහිර පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍ය කැප්ටන් ලලිත් වනිගරත්න වන මම 1972 අංක 07 දරන ගෙවල්කුලී පනතේ කාර්යයන් සඳහා 2018.01.02 වැනි දින සිට පහත සඳහන් නිලධාරිනිය බස්නාහිර පළාතේ ගෙවල් කුලී පනත ක්‍රියාත්මක කිරීමේ බලයලත් නිලධාරි වශයෙන් මෙයින් ප්‍රකාශ කරමි. පනත යටතේ ඇයට පැවරෙන බලතල හා කාර්යයන් ක්‍රියාවේ යෙදවිය යුතු ප්‍රදේශ, නිලධාරියාගේ නම ඉදිරියෙහි නිශ්චිතව සඳහන් කර ඇත.

| බලයලත් නිලධාරිනියගේ නම | ප්‍රදේශයන්, |
|---|---|
| මුහන්දිරන්ගේ තුෂාරි රුද්‍රිගෝ මිය. | කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක ඇතුළත් වන බස්නාහිර පළාත. |

03-380


1A – PG3933 – 50 (2018/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.